# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛන්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

*වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය*

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2012

2015 ජුනි/ජූලි

## BMGT E 3025 – කුඩා ව්‍යාපාර කළමනාකරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

01. (අ) කුඩා ව්‍යාපාර හඳුනා ගැනීමට යොදා ගන්නා එකම නිර්නායකය "ආයතනයක සේවක සංඛ්‍යාව" පමණි. ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහිද? විවිධ නිර්වචන ඇසුරින් පැහිදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) කුඩා ව්‍යාපාරයන්හි ගතිලක්ෂණ මොනවාද? පහදන්න.

(ලකුණු 05)

(ඇ) "සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනයට කුඩා ව්‍යාපාර එතරම් සැලකිය යුතු වැදගත් කාර්යභාර්යක් ඉටු නොකරයි." එහෙයින් එම අංශය වැඩි දියුණු කිරීම අවශ්‍ය නැත." මෙම ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. (අ) සුදුසු උදාහරණ සමඟින් නවෝත්පාදකයා (inventor) සහ නිර්මාපකයා (innovator) අතර වෙනස දක්වන්න.

(ලකුණු 04)

(ආ) සාර්ථක ව්‍යවසායකයකු සතු ප්‍රබල ගති ලක්ෂණ පහදන්න.

(ලකුණු 06)

(ඇ) "ව්‍යවසායකයෝ උපදිති." නැතහොත් "සංවර්ධනය කළ හැකිය." යන අදහස පිළිබඳව ඔබ කුමක් සිතන්නෙහිද? විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ඉ) ව්‍යවසායකත්ව වර්ධන ක්‍රියාවලිය කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03. (අ) "ක්ෂුද්‍ර පරිසරය" (micro environment) ව්‍යාපාරයක හදවත බඳු වේ. ක්ෂුද්‍ර පරිසරය තුළ ඇති විචල්‍යයන් කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ) ව්‍යාපාරයට පරිබාහිරින් ඇතිවන ධනාත්මක හා ඍණාත්මක බලපෑම් වලින් සමන්විත විචල්‍යයන්ගෙන් සාර්ව පරිසරය (macro environment) නිර්මාණය වී ඇත. පහත සඳහන් විචල්‍යයන් ව්‍යාපාරයකට බලපෑම් ඇති කරන්නේ කෙසේදැයි හඳුනාගෙන පහදන්න.

i. උද්ධමනය
ii. සමාජීය ආකල්ප
iii. කාලගුණික සහ දේශගුණික තත්ත්වයන්
iv. තාක්ෂණයේ ස්වභාවය
v. දේශපාලන ස්ථායීතාවය

(2 x 5 = 10)

(මුළු ලකුණු 20)

04. (අ) ව්‍යාපාරික අවස්ථා පෙරා ලබා ගැනීමේ ක්‍රියාවලිය විස්තරාත්මකව දක්වන්න.

(ලකුණු 13)

(ආ) ශඳු අත (SWOT) විශ්ලේෂණයේ වැදගත්කම කුමක්ද? නිදසුන් සහිතව පහදන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

05. (අ) කුඩා ව්‍යාපාරයන්හි අසමාර්ථයන් මොනවාද? විස්තර කරන්න.

(ලකුණු 10)

(ආ) ඒවාට සුදුසු විසඳුම් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. (අ) ව්‍යාපෘති වාර්තාවක් යනු කුමක්ද?

(ලකුණු 04)

(ආ) නව ව්‍යාපාරයක් සඳහා ව්‍යාපෘති වාර්තාවක ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 04)

(ඇ) ව්‍යාපෘති වාර්තාවක පහත සඳහන් මූලිකාංග පැහැදිලි කරන්න.

i. අලෙවි ශක්‍යතාවය

ii. තාක්ෂණික ශක්‍යතාව

iv. අමුද්‍රව්‍ය ශක්‍යතාවය

v. මූලය ශක්‍යතාවය

(3 x 4 = 12)

(මුළු ලකුණු 20)